ET/SSS/2022(2023)/OL/62/S/A/S-3

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ | 2022 (2023)

# Student Seminar Series

# ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව

Practice Paper | උපකාරක ප්‍රශ්න පත්‍ර

# Civic Education

# පුරවැසි අධ්‍යාපනය



**Answer Sheet - I, II | පිළිතුරු පත්‍රය - I, II (සිංහල මාධ්‍යය)**

Nenasa

e තක්සලාව

The National e-learning Portal for The General Education

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව | ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

## I පත්‍රය - පිළිතුරු

| ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 3 | 21. | 2 | 31. | 4 |
| 02. | 3 | 12. | 4 | 22. | 3 | 32. | 1 |
| 03. | 1 | 13. | 1 | 23. | 1 | 33. | 2 |
| 04. | 4 | 14. | 1 | 24. | 4 | 34. | 2 |
| 05. | 1 | 15. | 2 | 25. | 3 | 35. | 2 |
| 06. | 4 | 16. | 1 | 26. | 4 | 36. | 3 |
| 07. | 1 | 17. | 2 | 27. | 3 | 37. | 4 |
| 08. | 4 | 18. | 4 | 28. | 3 | 38. | 4 |
| 09. | 3 | 19. | 2 | 29. | 3 | 39. | 3 |
| 10. | 1 | 20. | 2 | 30. | 2 | 40. | 3 |

## පුරවැසි අධ්‍යාපනය 11 – (පිළිතුරු පත්‍රය)

01.
(I)
- එක් ජාතියක් සඳහා එක් රාජ්‍යයක් යන සංකල්පය මත පදනම් වීම
- භූමිය, ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපත්‍යය යන අංගවලින් සමන්විත වීම
- වෘත්තීය නිලබල පැලැන්තියක් මඟින් පාලන බලය මෙහෙයවීම
- අභ්‍යන්තර හා බාහිර කටයුතු සම්බන්ධයෙන් ස්වාධිපති බලය හිමි වීම

**(මින් ඕනෑ ම දෙකක්)**

(II)
- සදාචාරාත්මක
- නීතිමය

(III)
- භූමිය
- ශ්‍රමය
- ප්‍රාග්ධනය
- ව්‍යවසාය

**(මින් ඕනෑ ම දෙකක්)**

(IV)
- දේශපාලන
- ආගමික මතවාද
- සමාජ ආර්ථික තත්ත්වය
- වාර්ගිකත්වය **(මින් ඕනෑ ම දෙකක්)**

(V)
- ගිවිසුම්
- විවාහ සම්බන්ධ ගැටලු
- උරුමය සම්බන්ධ ගැටලු
- අයිතිවාසිකම්
- බැංකු, ව්‍යාපාර
- වාණිජ කටයුතු සම්බන්ධ ගැටලු
- ඉඩම් සම්බන්ධ ගැටලු **(මින් ඕනෑ ම දෙකක්)**

(VI)
- ස්වාධීන අධිකරණ පද්ධතියක් තිබීම
- නීතිය පිළිබඳව සෑම පුරවැසියෙකුට ම අවබෝධයක් තිබීම
- නීතිය නොදැන සිටීම නිදහසට කරුණක් ලෙස නොසැලකීම
- සාධාරණ ව හා අප්‍රමාද ව යුක්තිය පසිඳලීම
- පුද්ගලයන්ගේ තරාතිරම, රැකියාව, ධනය හෝ වෙනත් කරුණු පදනම් කර ගෙන නීතිය ක්‍රියාත්මක නොවීම
- නීතිය ඉදිරියේ සෑම දෙනා ම සමාන පුද්ගලයන් සේ සැලකීම
- විනිශ්චය කරුවන්ට තම තීන්දු ගැනීමේ දී බලපෑම් සිදු නොකිරීම

**(මින් ඕනෑ ම දෙකක්)**

(VII)
- හොඳින් සවන් දීම
- පක්ෂග්‍රාහී නොවීම
- මධ්‍යස්ථ වීම
- නිවැරදි තීරණ ගැනීම
- විචාරශීලී හා නිර්මාණශීලී බව
- සාධාරණභාවය

**(මින් ඕනෑ ම දෙකක්)**

(VIII)
- ක්‍රි.ව 1215 - බ්‍රිතාන්‍යයේ මැග්නා කාර්ටා ගිවිසුම
- ක්‍රි.ව1689 - බ්‍රිතාන්‍යයේ අයිතිවාසිකම් පනත
- ක්‍රි.ව1776 - ඇමෙරිකානු නිදහස් ප්‍රකාශනය
- ක්‍රි.ව 1789 - මිනිස් හා පුරවැසියන් පිළිබඳ ප්‍රංශ ප්‍රකාශනය
- ක්‍රි.ව 1917- රුසියානු විප්ලවය **(මින් ඕනෑ ම දෙකක්)**

(IX)

- සාක්ෂරතාව
- උපතේ දී ආයු අපේක්ෂාව
- ළදරු මරණ අනුපාතය **(මින් ඕනෑ ම දෙකක්)**

(X)

- ද්වි පාර්ශ්වික වෙළඳාම
- බහු පාර්ශ්වික වෙළඳාම

02.

(I)

- බහු පක්ෂ ක්‍රමය
- ද්වි පක්ෂ ක්‍රමය
- ඒක පක්ෂ ක්‍රමය **(මින් ඔනෑ ම දෙකක්)**

(II)

- සාකච්ඡා මඟින් තීරණවලට එළඹීම
- විරුද්ධ මත ඉවසීම
- බහුතර මතයට ගරු කිරීම
- සහයෝගයෙන් කටයුතු කිරීම
- මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම
- නීතිගරුක වීම
- අයිතිවාසිකම් භුක්ති විඳිමින් යුතුකම් ඉටු කිරීම
- සංවර්ධනාත්මක විවේචන ඉදිරිපත් කිරීම **(මෙවැනි ඕනෑ ම කරුණු තුනක්)**

(III) (a)

- ආණ්ඩු පක්ෂය විසින් ඉටු කරනු ලබන යහපත් කටයුතු සාර්ථක කර ගැනීමට සහයෝගය ලබා දීම
- ආණ්ඩු පක්ෂයේ ක්‍රියාකාරකම් ගැන සොයා බලා සංවර්ධනාත්මක විවේචන තුළින් ආණ්ඩුව සුමඟට යොමු කිරීම
- ආණ්ඩු පක්ෂයේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ප්‍රතිපත්තිවලට හා ක්‍රියාවන්ට විරුද්ධත්වය දැක්වීම
- වඩා යහපත් විකල්ප ආණ්ඩුවක් පිහිටුවීමට ක්‍රියා කිරීම

**(මින් ඕනෑ ම කරුණු තුනක්)**

(b) ඉහත එක් කරුණක් විස්තර කර තිබිය යුතු ය.

3.

(I) යාපනය, වන්නි

(II)

- මහ නගර සභා
- නගර සභා
- ප්‍රාදේශීය සභා

(III) (a)

- I වන ලැයිස්තුව ( පළාත් සභා ලැයිස්තුව)
- II වන ලැයිස්තුව (සංවෘත ලැයිස්තුව )
- III වන ලැයිස්තුව (සමගාමී ලැයිස්තුව)

(b) ඉහත එක් ලැයිස්තුවක බලතල දෙකක් දක්වා තිබිය යුතු ය.

4.

(I)

- විවිධ ජනවර්ග, විවිධ ආගමික විශ්වාස දරන විවිධ භාෂා කතා කරන පුද්ගලයින් සිටීම
- ඉහත විවිධත්වය නිසා ඇති වී තිබෙන ඒ ඒ සංස්කෘතීන්ට ආවේණික සිරිත් විරිත්, ආචාර ධර්ම හා ඇගයීම් පද්ධතියක් පැවතීම
- එක ජන කොටසක වුව ද ප්‍රාදේශීය විවිධත්වයක් දැකිය හැකි වීම
- වර්තමානය වන විට ලෝකයේ රටවල් , ජාතීන් වශයෙන් තම දේශ සීමාවලින් ඔබ්බට ගොස් විවිධ ජාතීන් සම්මිශ්‍ර වී බහු සංස්කෘතික සමාජ ගොඩ නැඟීම
- ලෝකය එක ම විශ්ව ගම්මානයක් බවට පත් වී සංස්කෘතික සම්මිශ්‍රණය වීම ඉතා වේගයෙන් සිදු වීම **(මෙවැනි කරුණු දෙකක්)**

(II)

- පිහිටීම
- සංක්‍රමණ
- ආක්‍රමණ
- විවිධ ජාතීන් වෙළඳාම සඳහා පැමිණීම
- ගෝලීයකරණය **(මින් ඕනෑ ම කරුණු තුනක්)**

(III) (a)

- ජාතික සමගිය හා සහජීවනය වර්ධනය වේ.
- ගැටුම් අවම වේ.
- අන්‍යෝන්‍ය සුහදත්වය හා විශ්වාසය වර්ධනය වේ.
- එක් ජාතියක්, එක් රටක් යන හැඟීම වර්ධනය වේ.
- මිනිස් නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු වේ.
- රටේ සංවර්ධනය වෙනුවෙන් සෑම පුරවැසියෙකු ම නොපිරිහෙළා කටයුතු කිරීම හා එය ජාතික යුතුකමක් සේ සලකා කටයුතු කිරීමට පෙලඹේ.
- අන්‍ය ආගම් හෝ සංස්කෘතියට අගරු නොවන ආකාරයට හැසිරීමට හුරු වේ.

**(මෙවැනි කරුණු තුනක්)**

(b) ඉහත සඳහන් ඕනෑ ම එක් කරුණක් විස්තර කර තිබිය යුතු ය.

5.

(I) ආහාර
නිවාස
ඇඳුම් පැලඳුම් **(මින් කරුණු දෙකක්)**

(II)

- නිෂ්පාදනය
- බෙදා හැරීම
- පරිභෝජනය

(III) (a)

- බහු ජාතික සමාගම් බිහි වීම
- විවිධ රටවල පවතින බදු සහන, අඩු මිල ශ්‍රමය, ලිහිල් පාරසරික නීති වැනි සාධක පදනම් කර ගෙන ආයෝජනය කිරීම
- විවෘත ආර්ථික ප්‍රතිපත්තිය ලෝකයට හඳුන්වා දීම
- විවිධ කලාපීය සහයෝගිතා සංවිධාන බිහි වීම
- දේශීය මුදල් විදේශවලට ඇදී යාම
- ලෝකයේ බලවත් රටවල් තම දේශපාලන බලය අනෙකුත් රටවලට ව්‍යාප්ත කිරීම
- තොරතුරු තාක්ෂණයේ විප්ලවීය වෙනසක් සිදු වීම
- වෙළදාමට තිබූ බාධා ඉවත් කරමින් නිර්බාධ වෙළදාම ඇති වීම
- ශ්‍රම හා ප්‍රාග්ධන සචලතා
- ලෝක නිෂ්පාදනය මත ආර්ථික කටයුතු සිදු වීම **(මෙවැනි ඕනෑ ම කරුණු තුනක්)**

(b) ඉහත සඳහන් ඕනෑ ම එක් කරුණක් විස්තර කර තිබිය යුතු ය.

6. (I)

- මහජන ඡන්දයෙන්
- ජාතික ලැයිස්තුවෙන්

(II)

- ඔම්බුඩ්ස්මන්ධුරය
- විධායක ජනාධිපතිධුරය
- සමානුපාතික නියෝජන ක්‍රමය
- ජනමතවිචාරණය
- අධිකරණ සේවා කොමිෂන් සභාව **(මින් කරුණු තුනක්)**

(III) (a)

- සම්පත් බෙදී යාමේ විෂමතා නිසා සමහර ප්‍රාදේශීය ඒකක වලට වාසිත්, ඇතැම් ප්‍රාදේශීය ඒකක වලට අවාසිත් සිදු වීම
- ප්‍රාදේශීය පාලන ඒකකවල කාර්යභාරය හා ජනතා අවශ්‍යතා ඉටු කර ගැනීමට යොමු විය යුතු ආකාර පිළිබඳව ජනතාවගේ දැනුම ප්‍රමාණවත් නොවීම
- බලතල ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාදේශීය ඒකක අතර ගැටලු ඇති වීම
- සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමට මුදල් උපයා ගැනීමේ දුෂ්කරතා
- ආයතන කිහිපයක් එක ම කාර්යයෙහි යෙදීම නිසා එම ආයතනවල වගවීම හා වගකීම සම්බන්ධ ගැටලු මතු වීම **(මින් කරුණු තුනක්)**

(b) ඉහත සඳහන් ඕනෑ ම එක් කරුණක් විස්තර කර තිබිය යුතු ය.

7.

(I)

- කර්මාන්ත මඟින්
- කෘෂි කාර්මික කටයුතු මඟින්
- ස්වාභාවික හේතු නිසා
- ගෘහස්ථ පරිභෝජනය මඟින් හා කුණු කසළ , මළ මඟින් අපවිත්‍ර වීම
- යාන වාහන සේදීම
- අම්ල වැසි මඟින්
- මැණික් හැරීම, පතල් කැණීම,නිවාස ඉදි කිරීම,පොළව යට ජල නළ එලීම, කෘතිම ජලාශ කැණීම, ගල් අඟුරු කැණීම
- ලවණ ජලය රට තුළට ගලා ඒම මඟින්
- සාගරය ආශ්‍රිතව න්‍යෂ්ටික අත්හදා බැලීම් හා යුද්ධමය අභ්‍යාස මඟින්

**(මෙවැනි කරුණු දෙකක්)**

(II)

- සමාජ සබඳතා බිඳ වැටීම
- ආගමික හා වාර්ගික ගැටුම් ඇති වීම
- සමාජ අසාධාරණකම් සිදු වීම
- පවුල් සංස්ථා බිඳ වැටීම
- දෙමාපිය දූ දරු සබඳතා බිඳ වැටීම
- සමාජ දුරාචාර වැඩි වීම
- සමාජ විරෝධී ක්‍රියා වැඩි වීම **(මෙවැනි කරුණු තුනක්)**

(III) (a)

- අධිපරිභෝජනයෙන් වැළකීම
- පරිසර හිතකාමී ආකල්ප වර්ධනය
- නීතිරීතිවලට අනුගත වීම
- නිසි ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම
- භෞතික පරිසරයට හානි නොකිරීම
- සම්පත් අරපිරිමැස්ම
- බලශක්ති සංරක්ෂණය
- පරිසර හිතකාමී ජීවන රටාව **(මෙවැනි කරුණු තුනක්)**

(b) ඉහත සඳහන් ඕනෑ ම එක් කරුණක් විස්තර කර තිබිය යුතු ය.

*****